**කින්නියා ප්‍රාදේශීය සභාව**

**----------------------------**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශ**

**--------------**

**1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම**

**------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2015 ජූලි 07 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2015 පෙබරවාරි 20 දින ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 01 දින සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලදි.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කින්නියා ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්**

**--------------------------------------**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම.**

**----------------------------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශයන් සමඟ ඉදිරිපත් කළයුතු වුවත් එම ප්‍රකාශයන් ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**-------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

ලෙජරය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට කාර්ය මණ්ඩල ණය ශේෂය රු.422,884 ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශයන්හි රු.443,884 ක් ලෙස දක්වා තිබුණු බැවින් කාර්ය මණ්ඩල ණය ශේෂය මූල්‍ය ප්‍රකාශයන්හි රු.21,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3. 4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

2006 වර්ෂයට ප්‍රථම සේවය හැර ගිය හෝ වෙනත් ආයතනයන්ට ස්ථාන මාරුවීම් ලබාගිය සේවකයන් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.137,749 ක් වූ හිඟ කාර්ය මණ්ඩල ණය ඔවුන්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

-----------------------------------------

පහත දැක්වෙන එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 6,290,992.00 | හිමිකම් ඔප්පු |
| පිරියත් සහ යන්ත්‍රසූත්‍ර | 1,308,575.00 | ස්ථාවර වත්කම් ලේඛනය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලීබඩු | 1,183,135.00 | ස්ථාවර වත්කම් ලේඛනය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| වාහන | 4,429,710.00 | ස්ථාවර වත්කම් ලේඛනය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| කලින් ලැබීම් | 183,544.00 | අත්තිකාරම් ලේඛනය සහ කාල විශ්ලේෂණය |
| ණය හිමියෝ | 2,699,687.00 | ශේෂ සනාථ කිරීමේ ලිපි |

**1.3.6 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

-----------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| | (i) 134 (1) වගන්තිය | - | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින නිශ්චල දේපළ හඳුනාගෙන වටිනාකම තක්සේරු කර වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) 219 වගන්තිය | - | රු.5,772,639 ක් වූ වෙළඳපොල කඩ බදු සහ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය සහ පරිපාලන) රීති - 1988 | | |
| | (i) I පරිච්ඡේදයේ 5(xii) වගන්තිය | - | මුදල් ගබඩා සහ චෙක්පත් අත්සන් කිරීම පරිපාලනමය වශයෙන් නිලධාරීන් තිදෙනෙකුට පවරා තිබුණු නමුත්, ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබාගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | VII පරිච්ඡේදයේ 158 වගන්තිය | - | සමුච්චිත වියදම් පිළිබඳ මාසික සාරාංශය පිළියෙල කර නොතිබුණි. |
| (iii) | VII පරිච්ඡේදයේ 164 වගන්තිය | - | ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් ගිණුම් වාර්තා දෛනිකව පරීක්ෂා කොට ශේෂයන්ගේ නිවැරදිතාවය සම්බන්ධයෙන් කෙටි අත්සන් යොදා නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 387 - ගෙවීම් නිලධාරියා විසින් ප්‍රමාණවත් බැංකු ශේෂයක් පවතින බවට සනාථ කිරීමෙන් පසු පමණක් චෙක්පත් ලිවිය යුතු වුවද, පසුගිය වර්ෂ 03 ක් තිස්සේ මුදල් පොත ප්‍රකාරව බැර ශේෂ පැවතියදී චෙක්පත් ලියා තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව රු.2,388,012 ක බැර ශේෂයක් පැවතුණි

(ඈ) පළාත් මූල්‍ය රීති (PFR)

-------------------------

| | | | |
|---|---|---|---|
| (i) | පළාත් මූල්‍ය රීති අංක 131:3 | - | මුදල් ලැබීම් සඳහා ලදුපත් නිකුත් කිරීමෙන් පසුව වගකිවයුතු නිලධාරීන් විසින් එම ලදුපත් උපපත්‍රිකා තමා භාරයේ ආරක්ෂාකාරීව තබාගත යුතුය. එසේ වුවද රු.3,370,974 ක් වූ ආදායම් එකතු කිරීම් වෙනුවෙන් නිකුත් කළ ලදුපත්වල උපපත්‍රිකා සමාලෝචිත වර්ෂය තුළදී නැතිවී තිබුණි. නමුත් මේ පිළිබඳව සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| (ii) | පළාත් මූල්‍ය රීති අංක 187:2 | | සමාලෝචිත වර්ෂය තුලදී එකතු වටිනාකම රු. 3,253,657ක් වූ ගෙවීම් වවුචර් 44ක් නැතිවී තිබුණු නමුත්ගණන්දීමේ නිලධාරියා විසින් මෙම කරුණ විගණකාධිපතිට පිටපතක් සහිතව පළාත් භාණ්ඩාගාරය වෙත වාර්තා කර නොතිබුණි. එසේම, එකතු වටිනාකම රු. 2,106,258ක් වූ ගෙවීම් වවුචර් 68ක් නැතිවී තිබුණු බැව් 2013 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී තිබුණද, මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

(ඉ) අංක අයිඒඅයි/2002/02 සහ 2002 නොවැම්බර් 28 දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය - පරිගණක උපාංග සහ පරිගණක මෘදුකාංග සටහන් කිරීම සඳහා වෙනම ලේඛන පවත්වා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.41,103 ක් වූ අතර එයට එරෙහිව ඉකුත් වර්ෂය සඳහා ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.203,899 ක් විය.

### 2.2 ආදායම් කළමනාකරණය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත ආදායම සහ තථ්‍ය ආදායම අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2014 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් | 35,000 | 205,829 | (170,829) |
| කුලී | 1,869,000 | 1,312,630 | 556,370 |
| සේවා සඳහා ගාස්තු | 500,000 | - | 500,000 |
| ආදායම් ප්‍රදාන | 10,102,402 | 9,203,878 | 898,524 |

#### 2.2.2 විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු අයකිරීම.

සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික පාර්ශවයන් විසින් ස්ථාපනය කර ඇති විදුලි සංදේශ කුළුණු 07 ක් වෙනුවෙන් ගාස්තු අය නොකිරීම නිසා වාර්ෂිකව සභාවට රු.21,000 ක් වූ ආදායමක් අහිමිව තිබුණි.

## 3. කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් සභාවට පරිත්‍යාග කරන ලද මෝටර් වාහන 06 ක වටිනාකම ඇස්තමේන්තු කර ගිණුම් ගත කිරීමට වර්ෂ 09 ක කාලයක් තිස්සේ කටයුතු කර නොතිබුණි.

(ආ) 1991 සිට 2014 වර්ෂය දක්වා පුස්තකාල සාමාජිකයන් වෙත නිකුත් කරන ලද පුස්තකාල පොත් 1,223 ක් ලබාගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) ගබඩා විෂයයන් 138 ක් සහ පුස්තකාල පොත් 329 ක ඌනතාවයක් පවතින බව 2014 වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩලය විසින් වාර්තා කර තිබුණු නමුත් සභාව විසින් මේ පිළිබඳව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) 2006 වර්ෂයේ සිට සේවකයන්ගෙන් අයකරගත් අර්ථසාධක අරමුදලේ දායක මුදල් රු.602,701 ක් සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් රු.60,181 ක් අදාල අරමුදල්වලට ප්‍රේෂණය නොකොට තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ඉ) එකතුව රු.2,372,668 ක් වූ විශ්‍රාම වැටුප් අරමුදලේ දායක මුදල් නිරවුල් නොකොට වර්ෂ 08 කට වැඩි කාලයක් හිඟව තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම් සඳහා ලියන ලද එකතු වටිනාකම රු.207,048 ක් වූ චෙක්පත් 23 ක් අදාල පුද්ගලයන්ට නිකුත් නොකොට කාර්යාලයේ රඳවාගෙන තිබුණු නමුත්, ඒවා නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි සඳහන් කර තිබුණි.

(උ) 2011 ජනවාරි සිට 2013 ඔක්තෝබර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා එකතුව රු.1,210,977 ක් වූ දායක මුදල් සේවක අර්ථසාධක අරමුදලට නොගෙවීම නිසා එම අරමුදල විසින් ගොනු කළ නඩුවක් සඳහා රු.540,772 ක් වූ දඩ මුදල් සහ රු.50,000 ක් වූ නෛතික වියදම් ගෙවීමට සභාවට සිදුවී තිබුණි.

(ඌ) තොග ලෙජරය අනුව 2015 අගෝස්තු 12 දිනට තොගයෙහි කසල දමන බඳුන් 251 ක් පැවතිය යුතු වුවද එදින සිදුකළ භෞතික පරීක්ෂණයේදී එවැනි තොගයක් නොපැවතුණි.

4. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ඝණ අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානය වටා රු.1,345,000 ක පිරිවැයකට කම්බි දැල් වැටක් ඉදිකිරීම සඳහා 2011 නොවැම්බර් 22 දින සභාව විසින් ගිවිසුමකට එළැඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තුව අනුව කම්බි දැල් වර්ග අඩි 2,979 ක් සවිකළ යුතු අතර එම කම්බි දැල්වල මුදුනට යකඩ දඬු සවිකළ යුතු නමුත් එම වැඩ විෂයන් ඉටුකර නොතිබුණු බැවින් අපේක්ෂිත ප්‍රතිලාභය ලබාගත නොහැකිව තිබුණි.

(ආ) ඝණ අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානයේ භූමියෙහි බොරළු සැපයීම, ඇතිරීම සහ සංපීඩක යන්ත්‍රයක් භාවිත කොට තැලීම සඳහා රු.1,430,000 ක මුදලක් ගෙවා තිබුණු නමුත්, සම්පීඩක යන්ත්‍රයක් මඟින් බොරළු තලා නොතිබුණු බැවින් භූමියේ ස්ථාන ගණනාවක වලවල් සෑදී තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරු විසින් ඉදිකරන ලද වැටෙහි අඩි 125 ක් දිග කොටසක් නොහඳුනන පුද්ගලයන් විසින් ගලවා ඉවත්කර ගෙන ගොස් තිබුණි. නමුත් සභාව විසින් මේ සම්බන්ධයෙන් නිසි පියවර ගෙන නොතිබුණි.

(ඈ) දැල් කම්බි වැට ඉදිරියෙහි සවිකරන ලද කොන්ක්‍රීට් කණු 16 කට අලාභහානි වී තිබුණු නමුත් එම කොන්ක්රීට් කණු ඉදිකිරීම සඳහා සභාව විසින් පියවර ගෙන නොතිබුණි.

5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම ස්වකීය ධාරිතා මට්ටමෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවිය යුතු බවට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ අංක 3 සහ 2005 නොවැම්බර් 08 දින දරන චක්‍රලේඛයේ 8 වැනි ඡේදය මඟින් කර තිබුණු නියමය ප්‍රකාරව සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාර්ය මණ්ඩල වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක නිලධාරීන් | 01 | - | 01 |
| සහායක කාර්ය මණ්ඩලය | 16 | 16 | - |
| සුළු සේවකයන් | 31 | 30 | 01 |
| එකතුව | 48 | 46 | 02 |

පසුගිය වර්ෂ 08 ක කාලයක් තිස්සේ පැවති කළමනාකරණ සේවයේ අධි ශ්‍රේණිය I තනතුරක් සහ පසුගිය වර්ෂ 03 ක කාලයක් තිස්සේ පැවති සුළු සේවක තනතුරු 04 ක පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

7. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් කළමනාකරණය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) අයවැය පාලනය
(ඉ) කොන්ත්‍රාත් කළමනාකරණය